## කොම්පෝස්ට් පොහොර සහතික කළ යුත්තේ ඇයි ?

කොම්පෝස්ට් පොහොර සඳහා ඇති ඉල්ලුම දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. මේ හේතුව නිසාම වර්තමාන වෙළඳපොළ තුළ විවිධ ආයතනවලින් නිෂ්පාදනය කරන විවිධ ආකාරයේ කොම්පෝස්ට් පොහොර අලෙවිය සඳහා ඇත. නමුත් මෙම කොම්පෝස්ට් පොහොර වල ගුණාත්මක භාවය පිළිබඳව ගැටළු පවතී. එයට ප්‍රධාන හේතුව වන්නේ වෙළඳපොලෙහි ඇති කොම්පෝස්ට් පොහොර වල ප්‍රමිතිය අධීක්ෂණය කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැති වීමය. මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් කොම්පෝස්ට් පොහොර සඳහා සහතිකකරණ ක්‍රියාවලියක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කර ඇත.

## කොම්පෝස්ට් පොහොර සහතික කිරීමේ ක්‍රියාවලියේ පියවර

01. අයදුම් පත්‍ර යොමු කිරීම
02. නිෂ්පාදන ස්ථානය පරීක්ෂාව සහ කොම්පෝස්ට් සාම්පල ලබා ගැනීම
03. විද්‍යාගාර විශ්ලේෂණය
04. ලියාපදිංචි සහතිකය ලබාදීම
05. අඛණ්ඩ පරීක්ෂාව සහ ලියාපදිංචි සහතිකය යාවත්කාලීන කිරීම

### 01. අයදුම් පත්‍ර යොමු කිරීම

- අයදුම් පත්‍රය මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙතින් හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබාගත හැක. www.doa.gov.lk
- අයදුම් පත්‍රය පුරවා ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක නිළධාරීවරයා ගේ නිර්දේශය සහිතව මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත එවීම
- ප්‍රමිතියෙන් යුතුව කොම්පෝස්ට් පොහොර නිපදවන බවට ගිවිසුම් පත්‍රයක් නිෂ්පාදන ආයතනය හා මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය අතර අත්සන් කිරීම කළ යුතුයි

### 02. නිෂ්පාදන ස්ථානය පරීක්ෂා කිරීම හා කොම්පෝස්ට් සාම්පල ලබා ගැනීම

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විමර්ශන නිළධාරීන් නිෂ්පාදන ස්ථානය හා නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කර සාම්පල ලබා ගැනීම සිදුකරනු ඇත
- විමර්ශන වාර්තාව මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත ලැබීමට සලස්වයි
- පොහොර සාම්පලය මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පාංශු විද්‍යාගාරය වෙත විශ්ලේෂණය සඳහා යවනු ලබයි





### 03. විද්‍යාගාර විශ්ලේෂණය

- විද්‍යාගාරයේදී කොම්පෝස්ට් පොහොර වල පහත සඳහන් ප්‍රමිතීන් තිබේදැයි පරීක්ෂා කරනු ඇත

| ලක්ෂණය | තිබිය යුතු තත්ත්වය |
|---|---|
| තෙතමනය | 25% අඩු (වියළි බරට සාපේක්ෂව) |
| වැලි | 20% අඩු (වියළි බරට සාපේක්ෂව) |
| අපද්‍රව්‍ය | කිසිවක් නොතිබිය යුතුයි |
| කැබලි ප්‍රමාණය | 4 mm වඩා වැඩි කැබලි උපරිම 2% |
| PH අගය | 6.5-8.5 අතර |
| EC | උපරිම $4 dsm^{-1}$ |
| නයිට්‍රජන් (N) | අවම 1% (වියළි බරට සාපේක්ෂව) |
| පොස්පරස් ($P_2O_2$) | අවම 0.5% (වියළි බරට සාපේක්ෂව) |
| පොටෑසියම් ($K_2O$) | අවම 1% (වියළි බරට සාපේක්ෂව) |
| මැග්නීසියම් ( MgO) | අවම 0.5% (වියළි බරට සාපේක්ෂව) |
| කැල්සියම් (CaO ) | අවම 0.7% (වියළි බරට සාපේක්ෂව) |
| කාබන් (C) | අවම 20% (වියළි බරට සාපේක්ෂව) |
| C/N අනුපාතය | 10-25 අතර |

- විද්‍යාගාර විශ්ලේෂණ වාර්තාව අදාල නිෂ්පාදන ආයතනයට ලැබීමට සලස්වන අතර, එහි පිටපතක් මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සහතිකකරණ අංශයට ද ලැබීමට සලස්වයි.

## 04. ලියාපදිංචි සහතිකය සහ ලේබලය

- නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ වාර්තාව සහ විද්‍යාගාර විශ්ලේෂණ වාර්තාව අනුව අදාල නිෂ්පාදන ආයතනය සහ නිෂ්පාදිත කොම්පෝස්ට් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පිරිවිතරයන් හා ගැලපේ දැයි පරීක්ෂා කිරීම
- ඉහත කරුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පිරිවිතර වලට ගැලපේ නම් වසරක කාලසීමාවක් සඳහා ලියාපදිංචි සහතිකය ලබා දෙනු ඇත
- ලියාපදිංචි සහතිකය ලබාගත් ආයතන සඳහා තම කොම්පෝස්ට් බෑගය මත දී ඇති ආකෘතියකට අනුව ''කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහතික කල කොම්පෝස්ට් පොහොර'' ලෙස ලේබලය යෙදීමට නිෂ්පාදන ආයතනයට අවසර හිමිවෙයි


ලි.ප.අ.

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදකයින්
ලියාපදිංචි කිරීමේ සහතිකය

තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

නම : ..........................................................

ලිපිනය : ..........................................................

..........................................................

..........................................................

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමිතීන්ට අනුකූල
ගුණාත්මක කොම්පෝස්ට් පොහොර නිපදවන ආයතනයක්
ලෙස ඉහත අංකය යටතේ ලියාපදිංචි කරන ලදී

වලංගු කාලය : .......................... සිට .......................... දක්වා

..........................................................
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)
අංශ ප්‍රධානී (කාබනික කෘෂි අංශය)
තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා
සංවර්ධන මධ්‍යස්ථානය
මාකඳුර

..........................................................
අතිරේක අධ්‍යක්ෂ
තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා
සංවර්ධන මධ්‍යස්ථානය
මාකඳුර

## 05. අඛණ්ඩ පරීක්ෂාව සහ යාවත්කාලීන කිරීම

- ලියාපදිංචි කොම්පෝස්ට් නිෂ්පාදකයින්ගේ නිෂ්පාදිත කොම්පෝස්ට් පොහොර අහඹු ලෙස පරීක්ෂා කිරීම
- එමගින් ප්‍රමිතියෙන් යුතුව කොම්පෝස්ට් පොහොර වෙළඳපලට නිකුත් කරන්නේ දැයි නිරන්තරව අධීක්ෂණය කිරීම
- අහඹු පරීක්ෂණ අනුව ප්‍රමිතියට නොමැති කොම්පෝස්ට් නිෂ්පාදකයින්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම සිදුකරයි

## 06. අයකිරීම

- ලියාපදිංචිය, පුහුණු කිරීම හා අධීක්ෂණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නොමිලේ සිදුකරනු ලැබේ
- සාම්පල පරීක්ෂා කිරීම සඳහා යන වියදම නිෂ්පාදන ආයතනය විසින් දැරිය යුතුය

# ඔබ දන්නවාද?

**වාර්ෂිකව රසායනික පොහොර ආනයනයට රුපියල් කෝටි 3000 කට වඩා අපේ මුදල් පිටරටට ඇදීයන බව**

**ප්‍රමිතියෙන් යුතු කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට ඔබත් එක්වන්න**

**රටේ ආර්ථික සංවර්ධනයට දායක වෙමින් ඔබේ අතමිට සරුකරගන්න**

**පුහුණුව, මගපෙන්වීම සහ ප්‍රමිති සහතිකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නොමිලේ!**


**වැඩි විස්තර සඳහා**

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)

තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර

දු.අ. 031 2298994

**තාක්ෂණික තොරතුරු**

ඒ.එස්.වයි.පී. රණසිංහ - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)



**සැකසුම**

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

**මුද්‍රණය**

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව





# කොම්පෝස්ට් පොහොර සහතික කිරීම

**ගුණාත්මක කොම්පෝස්ට් පොහොර සහතික කිරීම තුළින්,**

**නිෂ්පාදකයාට හොඳ මිලක්**
**ගොවි මහතාට හොඳ පොහොරක්**
**රටට සරු පසක්**




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය 2019